සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

# ලංකා ඉතිහාසය - I

25 S I

කාලය පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

විභාග අංකය: ..................................................

- ඈත අතීතයේ සිට ක්‍රි.ව 1978 දක්වා

උපදෙස්:-
* මෙම කොටස ප්‍රශ්න 40කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නකයට ප්‍රතිචාර පහ බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර තෝරා දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
* **මෙම කොටසට ලකුණු 40ක් දෙනු ලැබේ.**
* කොටස් දෙකටම මුළු කාලය පැය තුනකි.

## I කොටස

- අංක 1 **සිට** 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දි ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක්දැයි හඳුනාගෙන **එම අංකය** වරහන තුළ ලියන්න.

1. (1) කිතුල්ගල බෙලිලෙන (2) බටදොඹලෙන (3) පාහියංගල
(4) බෙල්ලන් බැඳී පැලැස්ස (5) බූන්දල ( )

2. (1) මහාතිත්ථ (2) ගෝකණ්ණ (3) ගොඩවාය
(4) භාරුකච්ඡ (5) දේවනගර ( )

3. (1) ජනනාථ මංගලම් (2) විජයරාජ පුර (3) කඳවුරු නුවර
(4) මුම්මුඩි චෝළ මණ්ඩලම් (5) පුලස්තිපුර ( )

4. (1) සඳකඩපහන (2) මුරගල (3) රාජසභා මණ්ඩපය
(4) කොරවක් ගල (5) වාහල්කඩ ( )

5. (1) රොබට් නොක්ස් (2) ක්වේරෝස් (3) මේජර් ඩේවි
(4) එමර්සන් ටෙන්ට් (5) ජෝන් ඩොයිලි ( )

6. (1) පූජාවලිය (2) දළදා සිරිත (3) දිව්‍යාවදානය
(4) සිංහල ථූපවංසය (5) රාජාවලිය ( )

7. (1) ඇරිස්ටෝටල් (2) ෆාහියන් (3) මෙගස්නීතිස්
(4) ටොලමි (5) ප්ලිනි ( )

8. (1) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ (2) ශ්‍රී විජය රාජසිංහ (3) කීර්ති ශ්‍රී රාජසිංහ
(4) රාජාධිරාජසිංහ (5) ශ්‍රී වික්‍රම රාජසිංහ ( )

9. (1) පොල්ගස් බද්ද (2) ඇඟ බද්ද (3) තුවක්කු බද්ද
(4) මුද්දර බද්ද (5) සුනබ බද්ද ( )

10. (1) ජෙෆ්රි බට්ලර් (2) රොබට් බ්‍රවුන්රිග් (3) වෙකවුන්ට් ටොරිංටන්
(4) ජේම්ස් ලොංඩන් (5) රොබට් චාමර්ස් ( )

* අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත.ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ . එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.

11. (1) සැස්සේරුව සෙල් ලිපිය - වෙළඳ ශ්‍රේණි ගැන
(2) තෝනිගල සෙල් ලිපිය - ධාන්‍ය තැන්පතු ක්‍රමයක් පිළිබඳව
(3) රජගල සෙල්ලිපිය - මිහිඳු හිමියන්ගේ ලංකා ගමනය පිළිබඳව
(4) අඹගමුව සෙල්ලිපිය - ලංකාව විසින් සිදුකළ විදේශ ආක්‍රමණ පිළිබඳව
(5) වේළෙක්කාර් පුවරු ලිපිය - දළදා වහන්සේගේ ආරක්ෂාව පිළිබඳව ( )

12. (1) දැදුරු ඔය - මාගල්ල වැව (2) මල්වතු ඔය - නාච්චදූව වැව
(3) මහවැලි ගඟ - කනදරා වැව (4) යාන් ඔය - හුරුළු වැව
(5) කලා ඔය - කලා වැව ( )

13. (1) සිරිසංඝබෝධි - සද්ධාතිස්ස
(2) ගජබානුක ගාමිනි - පළමුවන ගජබාහු
(3) මේඝවණ්ණාභය - ගෝඨාභය
(4) ළමැණි බෝනා මුගලන් - තුන්වන මොග්ගල්ලාන
(5) කාලිංග විජයබාහු - මාඝ ( )

14. (1) ලසර්දා - මුල්ලේරියාවෙල සටන
(2) පේරෝ ලෝපෙස්ද සූසා - දන්තුරේ සටන
(3) ජෙරනිමෝද අසවේදු - බලන සටන
(4) කොන්ස්තන්තීනූ ද සා - රන්දෙනිවෙල සටන
(5) පිලිප් ද ඔලිවේරා - ගන්නෝරුව සටන ( )

15. (1) තෝමස් මේට්ලන්ඩ් - අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය යළි පිහිටුවීම
(2) රොබට් බ්‍රවුන්රිග් - උඩරට රාජධානිය අත්පත් කර ගැනීම
(3) විල්මට් හෝර්ටන් - කෝල්බෲක් ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කිරීම
(4) ස්ටුවර්ට් මැකන්සි - මුඩුබිම් පනත පැනවීම
(5) වෙකවුන්ට් ටොරිංටන් - 1818 නිදහස් අරගලය මර්දනය කිරීම ( )

* අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම /ප්‍රකාශන/ දින වකවානු සමූහයක් x සහ y තීරවල දී ඇත. y තීරයේ දි ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. y තීරය x තීරය සමග ගැළපෙන අනු පිළිවෙලට සකස් කළවිට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.

x y

16. (i) දුටුගැමුණු - A රවිදේවි
(ii) වට්ටගාමිනී අභය - B කපිසීස
(iii) ධාතුසේන - C නන්දිමිත්‍ර
(iv) පළමුවන විජයබාහු - D මිගාර
(v) පළමුවන පරාක්‍රමබාහු - E ලංකාපුර

(1) BEADE (2) CBDAE (3) CBAEB (4) DEACB (5) EDABC

(.........)

x y

17. (i) වසභ - A හුරුළු වැව
(ii) මහසෙන් - B මහාවිලච්චිය වැව
(iii) පළමුවන උපතිස්ස - C නාච්චදූව වැව
(iv) දෙවන මොග්ගල්ලාන - D කන්තලේ වැව
(v) දෙවන අග්ගබෝධි - E තෝපා වැව

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC

(.........)

x y

18. (i) කොට්ටල් බද්ද - A අලි ඇතුන් පිළිබඳ කාර්යාංශය
(ii) කින්නර බද්ද - B තුඹල් කාර්යාංශය
(iii) කුරුවේ බද්ද - C ශිල්පීන් පිළිබඳ කාර්යාංශය
(iv) මඩිගේ බද්ද - D විවීමේ කාර්යාංශය
(v) බඩහැල බද්ද - E ප්‍රවාහන කාර්යාංශය

(1) AEDBC (2) BDEAC (3) CBDEA (4) CDAEB (5) DEBAC

(.........)

x y

19. (i) රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙන - A සර් පොන්නම්බලම් රාමනාදන්
(ii) මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන - B රත්මලානේ ධර්මාලෝක හිමි
(iii) පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන - C හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
(iv) වණ්ණාර්පන්නෙයි ශෛව ප්‍රභාශ විද්‍යාශාලෙයි - D වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමි
(v) තිරුනෙල්වේලිහි පරමේෂ්වර විද්‍යාලය - E ආරුමුගනාවලර්තුමා

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC

(.........)

| | x | | y |
|---|---|---|---|
| 20. | (i) | ඩී.එස සේනානායක | - A හර්තාල්ව්‍යාපාරය |
| | (ii) | ඩඩ්ලි සේනානායක | - B පෞද්ගලික පාසල් රජයට පවරා ගැනිම |
| | (iii) | එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක | - C ගොවිජනපද ව්‍යාපාරය |
| | (iv) | සර් ජෝන් කොතලාවල | - D ජනසතු කිරීමේ ව්‍යාපාරය |
| | (v) | සිරිමාවෝ බණ්ඩාරනායක | - E ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලැබිම |

(1) CADEB (2) CAEBD (3) CDAEB (4) DABCE (5) DABED

(.........)

* අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක්** අදාළ මාතෘකාවට නොගැලපේ. එය තෝරා අදාළ **අංකය** ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

21. රෝහණ රාජධානිය

1. මහානාග රජතුමා කිරිදිඔය අසබඩ මාගම අගනුවර කරගෙන රෝහණය පාලනය කළේය.
2. මහානාග රජතුමා අනුරාධපුර මෞර්ය වංශික දේවානම්පියතිස්ස රජතුමාගේ පෙළපතට අයත්ය.
3. රෝහණ රජ පරපුරේ ව්‍යාප්තිය ආරම්භ වන්නේ ගෝඨාභය රජතුමාගේ පාලන සමයේදිය.
4. මහානාග මාගම සිට රාජ්‍ය පාලන ආරම්භ කරන විටත් කතරගම දසබෑ රජවරු රුහුණ පාලනය කළහ.
5. කාවන්තිස්ස රජතුමා කතරගම දසබෑ රජවරු ඝාතනය කළ බව ළලාට ධාතු වංසයේ සඳහන්ය.

( )

22. රජරට වාරි කර්මාන්තය

1. මෙරට මුල්ම වාරි කර්මාන්ත ඉදිවීම ගම්වැව් නිර්මාණය තුළින් ආරම්භ විය.
2. ගම්වැව් වල ව්‍යාප්තිය හා වර්ධනය මෙරට රාජ්‍යත්වය වර්ධනය වීම කෙරෙහිද බලපෑ බව තහවුරු වී තිබේ.
3. මුල්වරට වාරි නිර්මාණය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබෙනුයේ පණ්ඩුකාභය රජුගේ පාලන සමයේදීය.
4. මහවැව් නිර්මාණය කිරීම දේවානම්පියතිස්ස රජු විසින් ආරම්භ කරන ලද බව මහාවංසයේ සඳහන් තොරතුරු වලින් අනාවරණය වේ.
5. මෙරට වාරි කර්මාන්තයේ උච්චතම අවස්ථාව පොළොන්නරු යුගයේ සමුද්‍රවාපී සංකල්පයෙන් සම්පූර්ණ විය.

( )

23. නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග

1. චෝළ රාජවංශිකයකු වීම
2. දේශීය ප්‍රභූ පෙළපත්වලින් එල්ල වූ විරෝධතා
3. රුහුණින් එල්ල වූ විරෝධතා
4. භික්ෂු සමාජය අවනත කර ගැනිම
5. රජවාසල නිලධාරීන්ගේ පක්ෂපාතීත්වය රඳවා ගැනීම

( )

24. ඩොනමෝර් කොමිසම් යෝජනා
   1. සර්වජන ඡන්දබලය ප්‍රදානය කිරීම.
   2. ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකය
   3. රාජ්‍ය සේවා කොමිසම
   4. විධායක කාරකසභා ක්‍රමය
   5. අමාත්‍ය මණ්ඩලය

( )

25. 1956 මහමැතිවරණය
   1. නිදහස් ලංකාවේ දෙවන මහා මැතිවරණයයි.
   2. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැඩි ආසන සංඛ්‍යාවකින් මැතිවරණය ජයග්‍රහණය කළේය.
   3. එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක මහතා අගමැති ධූරයට පත්විය.
   4. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය නොබැඳි ප්‍රතිපත්තිය ලෙස වෙනස් විය.
   5. ආර්ථික ප්‍රතිපත්තිය ජනසතුකරණය වැඩ පිළිළෙ ලෙස සැලසුම් කරන ලදී.

( )

* අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති ( A) (B) (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා

| | |
|---|---|
| (A) සහ (B) පමණක් නිවැරදිනම් | 1 ද |
| (A) සහ (C) පමණක් නිවැරදිනම් | 2 ද |
| (B) සහ (C) පමණක් නිවැරදිනම් | 3 ද |
| (C) සහ (D) පමණක් නිවැරදිනම් | 4 ද |

වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවැරදි නම් 5 ද වරහන තුළ ලියන්න

26. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩගැස්විමෙහිලා බලපෑ භූගෝලීය සාධක සම්බන්ධයෙන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද?
   (A) ශ්‍රී ලංකාව ඉන්දියාව ආසන්නයේ පිහිටීම නිසා මෙරට සංස්කෘතියට ඉන්දියානු සංස්කෘතික ලක්ෂණවල බලපෑම දක්නට ලැබේ.
   (B) ඉන්දියාවට ආසන්න වුවද ඉන්දියාවෙන් වෙන්ව පිහිටීම නිසා ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය ඊටම ආවේණික ලක්ෂණවලින් යුතුව ගොඩ නැගී ඇත.
   (C) ඉන්දියානු සාගරයේ මධ්‍යගතව පිහිටීම නිසා වාණිජ මධ්‍යස්ථානයක් වශයෙන් ජාත්‍යන්තරව පිළිගැනීමට ලක්විය.
   (D) මධ්‍ය කඳුකරයෙන් ආරම්භ වන ජලවහන පද්ධතිය අරීය රටාවක් ගැනිම නිසා ගංගාමුවදොර ආශ්‍රිතව වරායවල් හා වෙළඳ මධ්‍යස්ථාන බිහිවීම.

( )

27. රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය /ප්‍රකාශ නිවැරදි වේද?
   (A) ලංකාව දකුණු ඉන්දියාව ආසන්නව පිහිටා තිබීම නිසා නිරන්තරයෙන් එල්ලවන ආක්‍රමණ හමුවේ රජරට ආර්ථිකය දුර්වල වීම.
   (B) අනුරාධපුර යුගයේ දී මෙන්ම පොළොන්නරු යුගයේ අවසාන කාලයේ දීත් දුර්වල පාලකයින් බලයට පත්වීම.
   (C) පොළොන්නරු යුගයේ ප්‍රභල රජ පෙළපත් දෙක වූ මෞර්ය හා ලම්භකර්ණ වංශිකයන් අතර බල අරගල ඇති වීම.
   (D) සුගලා දේවිය රුහුණේ සිට කැරළි ගැසීම.

( )

28. පළමුවෙනි විමලධර්මසූරිය රජතුමා සම්බන්ධ යෙන් කවර ප්‍රකාශය /ප්‍රකාශ නිවැරදි වේද?

(A) සීතාවක රාජසිංහ රජු විසින් පියා වූ වීරසුන්දර බණ්ඩාර ඝාතනය කිරීමෙන් පසුව පෘතුගීසින් වෙතට පලා යෑම.

(B) දොන් පිලිප් නමින් බෞතිස්ම ලැබීම.

(C) පෘතුගීසින්ට එරෙහිව යමින් මහනුවර රාජධානියේ රජු ලෙස අභිශේක ලබා කුසුමාසන දේවිය විවාහ කර දි ගැනිම.

(D) කීරවැල්ලේ නමින් නව රජ පෙළපතක් ආරම්භ කිරීම.

( )

29. 1848 නිදහස් අරගලය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

(A) උඩරට රදළ ප්‍රභූන්ගේ මැදිහත් වීමෙන් සටන ආරම්භ විය.

(B) ටොරිංටන් ආණ්ඩුකාරවරයාගේ බදු ප්‍රතිපත්තිය කැරැල්ලට බලපෑ ආසන්නම හේතුවක් විය.

(C) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් උඩරට සමාජය තුළ ඇති කර තිබූ පීඩාකාරි ආර්ථික හා සමාජිය අර්බුධ දිගුකාලීන හේතුන් විය.

(D) වාරියපොළ සුමංගල හිමි 1848 දෙවන නිදහස් සටනට පැවිදිනායකත්වය සැපයූ භික්ෂූණ්වහන්සේ විය.

( )

30. මෙරට වතු ආර්ථිකයේ ආරම්භය හා වර්ධනය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

(A) කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල බලපෑම අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම, රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය මෙරට වතු වගාවට අවශ්‍ය පදනම දැමීය.

(B) වතුවගාව ආරම්භ වන්නේ කෝපි වගාව හඳුන්වා දීමෙනි.

(C) 19 වන සියවස දෙවන භාගයේ දී තේ වගාව ආරම්භ වූ අතර පසුව ප්‍රධාන වැවිලි බෝගය ලෙස ව්‍යාප්ත විය.

(D) ස්වදේශීය ධනවතුන්ගේ වගාවක් ලෙස පහතරට ප්‍රදේශවල පොල්වගාව ව්‍යාප්ත විය.

( )

* අංක 31සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

31. වසභ රජුට ''උතර'' හා ''දුටහ'' නමින් පුතුන් දෙදෙනෙකු සිටි බව තහවුරු කෙරෙන සෙල්ලිපි යුගලය කුමක්ද?

1. හබැස්ස හා තම්මැන්නාව  2. බෝවත්තේගල හා සිතුල්පව්ව
3. සිතුල් පව්ව හා සංඛ්‍යාල  4. මිහින්තලේ සහ තෝනිගල
5. වේවැල්කැටිය සහ වල්ලිපුරම් ( )

32. ත්‍රී සිංහලාධීශ්වර යන විරුදනාමය දැරූ රජතුමා වන්නේ,

1. දුටුගැමුණු රජතුමා ය  2. වසභ රජතුමා ය  3. නිශ්ශංකමල්ල රජතුමා ය
4. පළමුවන රාජසිංහ රජතුමා ය  5. දෙවන රාජසිංහ රජතුමා ය ( )

33. ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා වන්නේ

1. පොන්නම්බලම් රාමනාදන් ය  2. පොන්නම්බලම් අරුණාචලම් ය  3. සර් ජේම්ස් පීරිස් ය
4. ඩි. ඇස්.සේනානායක ය  5. සර්.ඩී.බී ජයතිලක ය ( )

34. සීමිත ඡන්ද ක්‍රමය හඳුන්වා දුන් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ

1. කෝල්බෲක් ආණ්ඩු ක්‍රමය යි 2. කෲව් - මැකලම් ආණ්ඩු ක්‍රමය යි 3. මැනිං ආණ්ඩු ක්‍රමය යි
4. ඩොනමෝර්‍ු ආණ්ඩු ක්‍රමය යි 5. සෝල්බරි ආණ්ඩු ක්‍රමය යි ( )

35. නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනාධිපතිවරයා වන්නේ,

1. සර් ඔලිවර් ගුණතිලක මහතා ය 2. ඩී. ඇස් සේනානායක මහතා ය
3. විලියම් ගොපල්ලව 4. සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය ය
5. ජේ.ආර් ජයර්ධන මහතා ය ( )

* අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දි ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | වැරදිය |
| 2 | නිවැරදිය | නිවැරදිය |
| 3 | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |
| 5 | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | ශ්‍රී ලංකාවට බුදු දහම දායද වීමට දේවානම්පියතිස්ස හා අශෝක අධිරාජ්‍යයා අතර පැවැති රාජ්‍ය තාන්ත්‍රීක සබඳතාවයද ප්‍රධාන හේතුවක් විය. | වළගම්බා රජසමයේ දී හේමමාලා කුමරිය සහ දන්ත කුමරු දන්ත ධාතුව ලංකාවට වැඩම කරවන ලදී. | ( ) |
| 37. | පළමු වන පැරකුම් රජතුමා අවට විදේශිය රාජ්‍යයන් සමග සමීප රාජ තාන්ත්‍රික සබඳතා පවත්වා ගන්නා ලද පාලකයෙකි. | බුරුමය සමග පැවති සාම්ප්‍රදායික වෙළඳාමට එල්ල වූ අභියෝග ජයගැනීම සඳහා පැරකුම් කිත්ති නුවරගල් සෙනවියා යටතේ සේනාවක් යවා බුරුමය අක්‍රමණය කරන ලදී. | ( ) |
| 38. | ලන්දේසීහු යාපනයේ පැවති සම්ප්‍රදායන් නීති රීති හා සිරිත් විරිත් ඇතුළත්කොට තේසවලාමෙයි නීති සංග්‍රහය හඳුන්වා දුන්හ. | ලන්දේසිහු සිය පරිපාලනය පවත්වාගෙන යාමේදි ලංකාවේ සැම දිසාවනියකම තිබූ කෝරළේ, පත්තු හා ගම් යන සම්ප්‍රදායික බෙදීම් හා නිලතල ධූරාවලිය තමනට වාසිදායක ලෙස පවත්වාගෙන ගියහ. | ( ) |
| 39. | මිෂනාරීවරුන් සුදර්ශන, කවට කතික, වැනි මුද්‍රනාල ආරම්භ කර ලේඛන මාධ්‍යය ආගමික ප්‍රචාරක කටයුතු වලට යොදා ගන්නා ලදී. | සටන්කාමී උද්ඝෝෂණ ව්‍යාපාර වලට මුලිකත්වය හිමිවීම ලංකාවේ ජාතික ව්‍යාපාරත්වයේ මූලික ලක්‍ෂණයකි. | ( ) |
| 40. | 1947 මෙරටට හඳුන්වා දුන් සෝල්බරි ආණ්ඩුක්‍රම අනුව 1948 වසරේදී ලංකාවට පූර්ණ ජාතික නිදහසක් ලැබුණි. | 1972 මැයි 22 දින සිට නව ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක කල අතර එය ශ්‍රී ලංකාවේ පළමු ජන රජ ව්‍යවස්ථාව ලෙස හඳුන්වනු ලැබේ. | ( ) |

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

# ලංකා ඉතිහාසය - II

25 S I

ඈත අතීතයේ සිට ක්‍රි.ව 1978 දක්වා

**උපදෙස් :-**

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ
* **පළමුවන** ප්‍රශ්නයටත් B හා C කොටස්වලින් අවම වශයෙන් **එක** ප්‍රශ්නය බැගින් තෝරාගෙන **තවත් ප්‍රශ්න තුනකටත්** පිළිතුරු සපයන්න.
(පළමු වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| i. කලාඔය | ii. පරාක්‍රම සමුද්‍රය | iii. ඌරාතොට | iv. වලවේ ගඟ |
| v. මීගමුව | vi. අනුරාධපුරය | vii. පොම්පරිප්පු | viii. ගෝකණ්ණ |
| ix. මහියංගනය | x. ගම්පොළ | xi. කුරුණෑගල | xii. බස්නාහිර පළාත |

(නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි)

## B කොටස

2. ''මහා වංසයේ මුල් කොටස මහා විහාරයේ වංසකතාවයි''
   i. මහා වංසයට ලියන ලද ටීකාව නම් කරන්න (ල. 1)
   ii. මහා විහාරය පිළිබඳව සැකෙවින් දක්වන්න (ල. 3)
   iii. මහා වංසය මහා විහාරයේ වංසකතාව ලෙස සැලකීම කොතෙක් දුරට සාධාරණ වන්නේද යන්න විග්‍රහ කරන්න. (ල. 5)
   iv. මහසෙන් රාජ්‍ය සමයේ අවසානය වනතෙක් මහා වංසයේ අඩංගු වන දේශපාලන හා ආගමික තොරතුරු සෙල්ලිපිවලින් තහවුරු වන ආකාරය විමසන්න. (ල. 7)

3. ''දේවානම්පියතිස්ස රාජ්‍ය සමය මෙරට ආගමික ඉතිහාසයේ මෙන්ම දේශපාලන ඉතිහාසයේ ද ඉතා වැදගත් සන්ධිස්ථානයකි.''
   i. දේවානම්පියතිස්ස රජතුමාට සමකාලින ඉන්දියානු අධිරාජ්‍යයා නම් කරන්න. (ල. 1)
   ii. දේවානම්පියතිස්ස රජ්‍ය සමයේ මෙරට බුදු දහම රැගෙන ඒම පිටුපස ඇති ඉන්දීය පසුබිම විස්තර කරන්න. (ල. 4)
   iii. ශ්‍රී ලංකාවේ බුදුදහමේ ව්‍යාප්තියට බලපෑ හේතු විග්‍රහ කරන්න (ල. 5)
   iv. බුදු දහම ශ්‍රී ලංකාවේ සමාජ , දේශපාලන හා සංස්කෘතික යන අංශ සම්බන්ධයෙන් සිදු කළ බලපෑම විවේචනාත්මකව විමසන්න. (ල. 6)

4. පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ මහසෙන් රජතුමාගේ කාර්ය සාඵල්‍යය විස්තර කරන්න.
   i. මහා විහාර විරෝධි ප්‍රතිපත්තිය
   ii. ආර්ථික හා ආගමික වැදගත්කම (ල.16)

5. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   i. නිශ්ශංකමල්ල රජතුමාගෙන් පසු පොළොන්නරු රාජධානියේ දේශපාලනය.
   ii. රජරට කෘෂි ආර්ථිකය
   iii. කුරුණෑගල යුගයේ සාහිත්‍යය
   iv. හය වන පරාක්‍රම බාහු රජතුමාගේ අවධියේ දේශපාලන වැදගත්කම (ලකුණු **08 x 02 =** 16යි)

## C කොටස

6. ලන්දේසීන් පහතරට මුහුදු බඩ ප්‍රදේශවල ගෙන ගිය පාලනය පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ විමසන්න.
   i. ආර්ථික ප්‍රතිපත්ති **(ල. 9)**
   ii. පාලන ප්‍රතිපත්ති **(ල. 7)**

7. සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ පරීක්ෂා කරන්න.
   i. අග්‍රාණ්ඩුකාරවරයා
   ii. අගමැති හා කැබිනට් මණ්ඩලය
   iii. ද්වී මාණ්ඩලික ව්‍යවස්ථාදායකය **(ල.16)**

8. නිදහස් ලංකාවේ අර්ථික සංවර්ධනය පහත දැක්වෙන මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.
   i. රාජ්‍ය ව්‍යවසාය ශක්තිමත් කිරීම **(ල. 4)**
   ii. කෘෂිකර්මාන්තය **(ල. 6)**
   iii. කර්මාන්ත **(ල. 6)**

9. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   i. දෙවන රාජසිංහ රජතුමා
   ii. උඩරට ගිවිසුම
   iii. 53 හර්තාලය
   iv. නිදහසින් පසු විදේශ ප්‍රතිපත්ති **(ලකුණු 08 x 02 = 16යි)**

විභාග අංකය

